සැබැවින්ම ගැත්තා සලාතය ඉටු කරයි. නමුත් ඔහුට ඒ සඳහා කුසල් සටහන් කරනු ලබනුයේ දහයෙන් එකක්, නවයෙන් එකක්, අටෙන් එකක්, හතෙන් එකක්, හයෙන් එකක්, පහෙන් එකක්, හතරෙන් එකක්, තුනෙන් එකක් හා අඩක් වශයෙනි

අබ්දුල්ලාහ් ඉබ්නු අනමා තුමා විසින් ප්රකාශ කරන ලදී. අම්මාර් ඉබ්නු යාසිර් තුමා මස්ජිදයට පිවිස සලාතය ඉටු කරනු මම දුටුවෙමි. එවිට හෙතෙම සලාතය සැහැල්ලුවෙන් ඉටු කළහ. හෙතෙම තවදුරටත් මෙසේ පැවසීය: එතුමා පිටත්ව ගිය කල්හි එතුමා ඉදිරියේ නැගිට සිට 'අහෝ අබූ යක්ළාන්, ඔබ සලාතය සැහැල්ලුවෙන් ඉටු කළෙහිය.' යැයි කීවෙමි. එතුමා: "එහි සීමාවන් අතරින් කිසිවක් හෝ මම අඩු කරනු ඔබ දුටුවෙහි ද? යැයි ඇසීය. මම "නැත" යැයි පැවසුවෙමි. ඔහු: 'සැබැවින්ම මම ෂෙයිතාන්ව මඟහරවා ගන්නට එය ඉක්මණින් කළෙමි' යැයි පවසා, "අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පවසා සිටිනු මම අසා
ඇත්තෙමි. "සැබැවින්ම ගැත්තා සලාතය ඉටු කරයි. නමුත් ඔහුට ඒ සඳහා කුසල් සටහන් කරනු ලබනුයේ දහයෙන් එකක්, නවයෙන් එකක්, අටෙන් එකක්, හතෙන් එකක්, හයෙන් එකක්, පහෙන් එකක්, හතරෙන් එකක්, තුනෙන් එකක් හා අඩක් වශයෙනි." යැයි කීහ. [حسن] [رواه أحمد]

අම්මාර් ඉබ්නු යාසිර් (රළියල්ලාහු අන්හුමා) තුමා මස්ජිදයට පිවිස අතිරේක සලාත් ඉටු කළහ. එය ඉතා සැහැල්ලුවෙන් විය. එතුමා මස්ජිදයෙන් පිටත් වූ කල්හි අබ්දුල්ලාහ් බින් අනමා එතුමා පසුපසින් ගොස් එතුමාගෙන් මෙසේ විමසීය. "අහෝ අබූ යක්ළාන් ඔබතුමා ඔබේ සලාතය සැහැල්ලුවෙන් ඉටු කරනු මම දුටුවෙමි." අම්මාර් තුමා මෙසේ පැවසීය. "එහි මූලිකාංග, එහි අනිවාර් යය ක්රියාවන් හා එහි කොන්දේසි අතරින් කිසිවක මා අඩුවක් කර ඇති බව ඔබ දුටුවෙහි ද?" ඔහු "නැත" යැයි පිළිතුරු දුන්නේය. එතුමා: "ෂෙයිතාන් මගේ අවධානය වෙනතකට යොමු කිරීමට පෙර එය මා සැහැල්ලුවෙන් ඉටු කළෙමි." යැයි අම්මාර් පැවසීය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්රකාශයකට මම සවන් දී ඇත්තෙමි. සැබැවින්ම ගැත්තා සලාතය ඉටු කරයි. නමුත් ඔහුට කුසල් සටහන් කරනු ලබනුයේ දහයෙන් එකක්, නවයෙන් එකක්, අටෙන් එකක්, හතෙන් එකක්, හයෙන් එකක්, පහෙන් එකක්, හතරෙන් එකක්, තුනෙන් එකක් හා අඩක් වශයෙනි.

http://www.sunnah.global/hadeeth/si/show/65468